විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය
தலைமுறையொன்றின் பெருமிதம்
Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. Pen/Pol/06/26-2025

ඔබේ අංකය / உமது இல. / Your No. ..................................

දිනය / திகதி / Date 2025.11.18

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 07/2025**

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන්

ත්‍රිවිධ හමුදාධිපතිවරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>2025.04.01 දිනෙන් පසුව සේවයෙන් විශ්‍රාම ගෙන 2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත නව වැටුප් පරිමාණ අනුව විශ්‍රාම වැටුප් නොලබන විශ්‍රාමික නිලධරයන්ගේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සංශෝධනය කිරීම</u>**

2025.04.01 දින ද සේවයේ යෙදී සිට ඉන්පසුව සේවයෙන් විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය 2025 අයවැය යෝජනා අනුව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025, කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2025, 03/2025, 04/2025 සහ 05/2025 පරිදි අදාළ වන විධිවිධාන අනුව සකස් කළ යුතු වේ.

02. එසේ වුවත් 2025.04.01 දිනෙන් පසුව සේවයෙන් විශ්‍රාම ගෙන ඇති ඇතැම් නිලධරයන්ට අදාළව 2025 අයවැය යෝජනා අනුව ප්‍රකාශිත නව වැටුප් පරිමාණයන්ට පූර්වයෙන් පැවති වැටුප් පරිමාණයන් මත පදනම්ව විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර (PD 03) ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ඔවුන් වෙත ප්‍රථම විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සිදු කර ඇත. එම නිලධරයන්ගේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය 2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත නව වැටුප් පරිමාණයන් අනුව සංශෝධනය කිරීම සිදු කළ යුතුව ඇත.

03. ඒ සඳහා මේ සමඟ ඇති ඇමුණුම 01 හි සඳහන් අයදුම්පත්‍රය මගින් අවශ්‍ය තොරතුරු මාර්ගගත නොවන ක්‍රමවේදය ඔස්සේ විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය වෙත ගෙන්වා ගැනීමට තීරණය කර ඇත.

04. ඊට අදාළව පහත පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

i. ඔබ ආයතනයට අදාළව 2025.04.01 දිනෙන් පසුව විශ්‍රාම ගොස් ඇති නිලධරයන් අතරින් ඉහත සඳහන් නව වැටුප් පරිමාණ අනුව විශ්‍රාම වැටුප් නොලබන විශ්‍රාමික නිලධරයන් පිළිබඳ තොරතුරු ඇමුණුම 01 හි අයදුම්පත්‍රය අනුව සකස් කළ යුතු ය.

ii. එහි දී විශ්‍රාමික නිලධරයා මේ වන විට ලබමින් සිටින විශ්‍රාම වැටුප, ලබා ගත් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, නිලධරයා විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී නව වැටුප් පරිමාණ අනුව නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන ලද මුදල, නව වැටුප් පරිමාණ අනුව 2027.01.01 දිනට හිමිවන සම්පූර්ණ මාසික වැටුප යන තොරතුරු නිවැරදිව ඇතුළත් කළ යුතු ය.

iii. ඉහත (04) (ii) හි තොරතුරු අනුව නිලධරයා විශ්‍රාම ගන්වන අවස්ථාවේ දී නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන ලද මුදල මත පදනම්ව හිමිවිය යුතු විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, ගෙවිය යුතු හිඟ පාරිතෝෂිකය, 2027.01.01 දිනට හිමි වන සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව හිමිවිය යුතු මාසික විශ්‍රාම වැටුප සහ ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප ගණනය කර එම තොරතුරු අයදුම්පත්‍රයෙහි ඇතුළත් කළ යුතු ය.

iv. ඉහත පරිදි සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව සහිත අයදුම්පත්‍රය පහත ලේඛන සමඟ මෙම දෙපාර්තමේන්තුවේ විමධ්‍යගත අංශය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

(අ) දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුපට අදාළව නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ පිටපතක්

(ආ) 2025 අයවැය යෝජනා අනුව සකස් කරන ලද අවසන් වැටුප් පරිවර්තන ලිපිය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය / කළමනාකරණ සේවා චක්‍රලේඛ, වැටුප් කණ්ඩය හා වැටුප් පියවර සහිතව)

05. ඉහත පරිදි යොමු කරන තොරතුරු අනුව විශ්‍රාමික නිලධරයා වෙත හිඟ විශ්‍රාම වැටුප සහ හිඟ පාරිතෝෂිකය ගෙවීම් කිරීම ද, සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

06. මෙම උපදෙස් ලිපිය අනුව කටයුතු කිරීමේ දී එහි විධිවිධාන සම්බන්ධයෙන් පැහැදිලි කර ගැනීම හෝ වැඩිදුර උපදෙස් අවශ්‍යවන අවස්ථාවල දී පහත සඳහන් දුරකතන අංක වෙත සම්බන්ධ විය හැකි ය.

| අනු අංක | තනතුර | දුරකතන අංක |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) | 011 2 421 786 |
| 02 | අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්) | 011 2 320 045 |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත විශ්‍රාම වැටුප්) | 011 2 322 278 |


Achami

**චාමින්ද හෙට්ටිආරච්චි**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com


**පිටපත් :**

1) ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
7) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
8) ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
9) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.
10) පාර්ලිමේන්තු මහ ලේකම් - කරු. දැ.ගැ.ස.

ඇමුණුම 01

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10.

විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංශෝධන අයදුම්පත

| විශ්‍රාම වැටුප් අංකය (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි) | |
|---|---|

## නිලධරයාගේ තොරතුරු :

සිවිල් ☐ හමුදා ☐

1. නිලධාරියාගේ / නිලධාරිනියගේ සම්පූර්ණ නම (පූජ්‍ය/මයා/මිය/මෙය) :- ..............................................
..............................................................................................................

2. මුලකුරු සමඟ අගට යෙදෙන නම:- (ENGLISH BLOCK LETTERS)

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

3. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

4. උපන් දිනය :- ..............................................
5. විශ්‍රාම ගිය දිනය :- ..............................................
6. ස්ථිර පදිංචි ලිපිනය :- ..............................................
..............................................................................................................
7. පෞද්ගලික දුරකතන අංකය :- ..............................................

## සේවා තොරතුරු :

8. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය:- ..............................................
..............................................................................................................
9. ආයතනය සෘජුව සම්බන්ධ කළ හැකි දුරකතන අංකයක් :- ..............................................
10. විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිකය සංශෝධනයට අදාළ වන්නා වූ හේතුව :- ..............................................
..............................................................................................................
11. වැටුප් විස්තරය :-

| | | විශ්‍රාම වැටුප් හිමිගන්වා ඇති වැටුප් පරිමාණය අනුව | | අදාළ නව වැටුප් පරිමාණය පරිදි විශ්‍රාම යන අවස්ථාවේ නිලධරයාට ගෙවූ මුදල අනුව | | 2027.01.01 දිනට නව වැටුප් පරිමාණය අනුව | |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | ශත | රු. | ශත | රු. | ශත |
| I | විශ්‍රාම යන දිනයට වාර්ෂික ඒකාබද්ධ වැටුප | | | | | | |
| II | වයස අවු.60 සම්පූර්ණව විශ්‍රම යන්නේ නම් උපයාගත් වැටුප් වර්ධක අගය | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| III | විශ්‍රාම වැටුප් සහිත දීමනා<br>(හිමි නම් පමණි)<br>1.<br>2.<br>(දීමනාව කුමක් ද යන්න පැහැදිලිව සටහන් කරන්න) | | | | | | |
| IV | විශ්‍රාම වැටුප් ගණනයට අදාළ දළ වාර්ෂික වැටුප | | | | | | |
| V | විශ්‍රාම ගන්නා දිනට හිමි දළ වාර්ෂික වැටුපට අදාළ චක්‍රලේඛ අංකය | | | | | | |

12. විශ්‍රාම යන දිනට වාර්ෂික වැටුප් ප්‍රමාණය :- ..........

13. අවසන් වැටුප් වර්ධක දිනය:- ..........

14. සංශෝධිත විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කළ යුතු දිනය :- ..........

15. ප්‍රතිශත ගණනය කිරීම :-

| | | විශ්‍රාම වැටුප් හිමිගත්වා ඇති වැටුප් පරිමාණය අනුව | | අදාළ නව වැටුප් පරිමාණය පරිදි විශ්‍රාම යන අවස්ථාවේ නිලධරයාට ගෙවූ මුදල අනුව | | 2027.01.01 දිනට නව වැටුප් පරිමාණය අනුව | |
|---|---|---|---|---|---|---|---|
| | | අඩු කළ % | අඩු නොකළ % | අඩු කළ % | අඩු නොකළ % | අඩු කළ % | අඩු නොකළ % |
| I | සේවා කාලය අවු.25 හෝ ඊට වැඩි නම් හිමි ප්‍රතිශතය | | | | | | |
| II | සේවා කාලය අවු.25ට අඩු නම් අවු.25ක සේවා කාලයට හිමි ප්‍රතිශතය | | | | | | |
| III | වසර අවු.25ට අඩු නම් සෑම 6 මාසයක් හෝ ඊට අඩු සෑම කාල සීමාවක් සඳහා 1% බැගින් අඩු කළ යුතු ප්‍රතිශතය (වසර 25ට වැඩි නම් අනවශ්‍යයි) | | | | | | |
| IV | වැටුප් රහිත මාසයක් හෝ ඊට අඩු සෑම කාල සීමාවක් වෙනුවෙන් 0.2% බැගින් අඩු කළ යුතු ප්‍රතිශතය (වි.වැ.චක්‍රලේඛ 9/96) | | | | | | |
| V | ඉහත ගැලපීම් වලින් පසුව නිලධාරියාට විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා පදනම් කර ගත යුතු ශුද්ධ ප්‍රතිශතය | | | | | | |

16. සංශෝධිත පාරිතෝෂික මුදල ගණනය කිරීම :-

| | | රු. | ශත |
|---|---|---|---|
| I | නිලධරයා විශ්‍රාම ගන්නා අවස්ථාවේ නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව ගණනය කරන පරිවර්තිත පාරිතෝෂිකය (දළ වාර්ෂික වැටුප x අඩු නොකළ ප්‍රතිශතය x 2) | | |
| II | මේ වන විට හිමිගත්වා ඇති පරිවර්තිත පාරිතෝෂික මුදල | | |
| III | ගෙවිය යුතු හිඟ පාරිතෝෂික මුදල | | |

17. 2025.11.30 දක්වා ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප :- ........................................................................................................

.........................................................................(තනතුර) ලෙස සේවය කළ ..........................................................................(නම) අයදුම්කරුගේ තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, එමෙන්ම ඔහුට හිමි හිඟ පාරිතෝෂික මුදල විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට සෘජුව ප්‍රේෂණය කිරීම සුදුසු බවටත් නිර්දේශ කරමි.

දිනය :- .......................

.............................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

නම සහිත නිල මුද්‍රාව

සටහන : ඉහත තොරතුරු වලට අමතරව සංශෝධනය සිදු කිරීමට අවශ්‍ය පහත ලේඛන අමුණා එවිය යුතු ය.

(අ) දැනට ගෙවනු ලබන විශ්‍රාම වැටුපට අදාළව නිකුත් කර ඇති විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ පිටපතක්

(ආ) 2025 අයවැය යෝජනා අනුව සකස් කරන ලද අවසන් වැටුප් පරිවර්තන ලිපිය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය/ කළමනාකරණ සේවා චක්‍රලේඛ, වැටුප් කණ්ඩය හා වැටුප් පියවර සහිතව)